සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 6 ශ්‍රේණිය
## විද්‍යාව

**නම/විභාග අංකය :- ..........................................................................................** **කාලය : පැය 02 යි.**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. වර්ධනය යම් කාලයකට පසුව නවතින ජීවියා වන්නේ,
(1) තණකොළ (2) අඹ (3) පොල් (4) බල්ලා

02. පිදුරු පල් කළ ජලයේ දැකිය හැකි ක්ෂුද්‍ර ජීවීන් වර්ගයක් වන්නේ,
(1) ඇමීබා (2) පැරමීසියම් (3) බැක්ටීරියා (4) එවුග්ලීනා

03. ස්කන්ධයක් සහිත අවකාශයේ ඉඩක් ගන්නා ද්‍රව්‍යයකි.
(1) වාතය (2) තාපය (3) ශබ්දය (4) ආලෝකය

04. විද්‍යාගාරයේ දී ද්‍රව පරිමා මැන ගැනීමට යොදා ගන්නා උපකරණයක් වන්නේ,
(1) බීකරය (2) පරීක්ෂණ නලය (3) මිනුම් සරාව (4) ප්ලාස්කුව


05. ජීවීන්ට ජීවය පවත්වා ගැනීමට ජලය වැදගත් වන ආකාරයක් වන්නේ,
(1) සනීපාරක්ෂක කටයුතු සඳහා (2) කෘෂිකාර්මික කටයුතු සඳහා
(3) ජල විදුලිය නිපදවීමේ දී (4) සතුන්ගේ ආහාර ජීර්ණය සඳහා

06. සර්පිනාවක ධ්වනිය නිපදවෙන ක්‍රමයට සමානව ධ්වනිය නිපදවන සංගීත භාණ්ඩයකි.
(1) වයලීනය (2) සිතාරය (3) රබාන (4) බටනලාව

07. ශාක තුළ පමණක් සිදුවන ජීව ක්‍රියාවලියක් වන්නේ,
(1) වර්ධනය (2) චලනය (3) ප්‍රභාසංස්ලේෂණය (4) ශ්වසනය

08. ජීවීන් ශ්වසනයේ දී පිටකරන වායුව හඳුනාගැනීමට යොදා ගනු ලබන්නේ,
(1) ජලය (2) අවර්ණ හුණු දියර
(3) සෝඩියම් ක්ලෝරයිඩ් (4) පල්මානික්කම්

09. මෙම උපකරණය යොදාගනු ලබන්නේ ශාකයක කුමන ලක්ෂණයක් නිරීක්ෂණය සඳහා ද?
(1) බර
(2) උස
(3) වර්ධනය
(4) චලනය





LIVEWORKSHEETS

10. නිශ්චිත පරිමාවක් ඇතත් නිශ්චිත හැඩයක් නොමැති පදාර්ථය වන්නේ,

(1) රසදිය (2) හඳුන්කූරු දුම (3) ඔක්සිජන් වායුව (4) පුළුන්

11. රළු වයනයක් සහිත පදාර්ථය වන්නේ,

(1) පුයර (2) පුළුන් (3) වැලි කඩදාසි (4) යකඩ

12. කලපු පරිසරයේ වැඩෙන ශාකයකි,

(1) කිරල (2) බිම්තඹුරු (3) වැටකෙයියා (4) පතොක්

13. රූපයේ දැක්වෙන ක්‍රියාකාරකම අවසානයේ දී දැකිය හැකි නිරීක්ෂණය වඩාත් ම නිවැරදිව දැක්වෙන පිළිතුර වනුයේ,




(1) අයිස් කැට දියවී යාම.
(2) ජලය සිසිල් වීම.
(3) කාඩ්බෝඩ් කැබැල්ලේ ජල වාෂ්ප තැන්පත් වීම.
(4) වීදුරුවේ පිටත ජලවාෂ්ප තැන්පත් වීම.

14. පහත දැක්වෙන වගන්ති අතුරින් නිවැරදි වන්නේ,

(1) සතුන් ස්වයංපෝෂී වේ.
(2) සතුන්ගේ හරිතප්‍රද වර්ණකය නැත.
(3) ශාකවල ආහාර නිපදවීමට ඔක්සිජන් වායුව අවශ්‍ය වේ.
(4) ශාකවල වර්ධනයේ සීමාවක් ඇත.

15. චුම්භකයක් ගෙන සිදු කරන ලද පහත ක්‍රියාකාරකමෙන් එළඹෙන නිගමනය වන්නේ,




(1) චුම්භකයේ දෙකෙළවර යකඩ කුඩු වැඩිපුර ඇත.
(2) චුම්භකයේ ධ්‍රැවවල ආකර්ශන බල වැඩි බවයි.
(3) චුම්භකයක උත්තර හා දක්ෂිණ ධ්‍රැව 02ක් ඇති බවයි.
(4) චුම්භකයක මැද ආකර්ශණ බල නැති බවයි.

16. පරිසරයේ ඇතිවන ශබ්ද අතරින් කෘතිමව හා ස්වභාවිකව ඇති වන ශබ්ද පිළිවෙළින් අඩංගු වන්නේ,

(1) සන්ටාර හඬ, විදුලි කෙටීම. (2) සීනු හඬ, මෝටරයක හඬ
(3) මුහුදු රළ නැගීම, නළා හඬ (4) කුරුලු නාදය, ටකයක හඬ

17. දීප්ත හා අදීප්ත වස්තුවක් පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ,

(1) රැ බදුල්ලා, චන්ද්‍රයා (2) කණාමැදිරියා, සූර්යයා
(3) ග්‍රහලෝක, චන්ද්‍රයා (4) චන්ද්‍රයා, හතු

18. පාරාන්ධ, පාරදෘශ්‍ය හා පාරභාසක ද්‍රව්‍ය පිළිවෙළින් අඩංගු පිළිතුර වන්නේ,

(1) තාර, තෙල් කඩදාසි, වීදුරු (2) ලී, බොර ජලය, ටිෂූ කඩදාසි
(3) කඩදාසි, අවර්ණ පොලිතීන්, තෙල් කඩදාසි (4) ලෝහ, වීදුරු, අවර්ණ පොලිතින්

19. ආලෝකයෙන් ලැබෙන ප්‍රයෝජනයක් **නොවන්නේ**,

(1) ශාකවල ආහාර නිෂ්පාදනයට, (2) සන්නිවේදන කටයුතුවලට,
(3) අනතුරු අඟවන සංඥා ලබාදීමට (4) විදුලි බුබුළු නිෂ්පාදනයට

20. අනාගතයේ ඇතිවිය හැකි ශක්ති අර්බුදයට පිළියමක් **නොවන්නේ**,

(1) ශක්ති පරිභෝජනය අඩු කිරීම. (2) අරපරිස්සමෙන් ශක්තිය භාවිත කිරීම.
(3) පොසිල ඉන්ධන වැඩිපුර භාවිත කිරීම. (4) විකල්ප ශක්ති ප්‍රභව භාවිත කිරීම. (ලකුණු 20)



LIVEWORKSHEETS